# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,928 - 2015 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2015.08.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 544 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 549 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/45/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.08.21 වැනි දින සිට 2015.09.04 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.09.11 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල 65/284, 285 දරන පත්ඉරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ වැල්ලවත්ත බොස්වෙල් පෙදෙස පිහිටි 'මහවැල්ලවත්ත' නැමති වරිපනම් අංක 32 දරන ඉඩමට බලයලත් මානක වී. ඒ. එල්. සේනාරත්න විසින් 1954.12.10 දින මැන සාදන ලද අංක 686 පිඹුර ප්‍රකාර ලොට් 18ඒ සඳහා මායිම්,<br><br>*උතුර* : ලොට් 10ඒ, 12බී සහ 10බී<br>*නැගෙනහිර* : ලොට් 18බී<br>*දකුණ* : බොස්වෙල් පෙදෙස<br>*බටහිර* : ලොට් 17බී<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 21.50 | 01. ජී. ඒ. තිස්සංක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.02.19 දින ලියා සහතික කරන ලද අංක 1943 දරන තෑගි ඔප්පුව |

08 - 349

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/39/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.08.07 වැනි දින සිට 2015.08.21 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.08.28 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1298 වෙළුමේ 262 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ පැලැන්වත්ත පිහිටි 'මහායාය හෙවත් මහායාය හේන්බිම' නැමති ඉඩමට බලයලත් මානක ඩී. ජේ. නානායක්කාර මහතා විසින් 1981.04.08 දින මැන සාදන ලද අංක 2374 දරන පිඹුරේ ලොට් 109 සඳහා මායිම්,<br><br>*උතුර* : ලොට් 11<br>*නැගෙනහිර* : ලොට් ජී (අඩි 20ක් පළල පාර)<br>*දකුණ* : ලොට් 108<br>*බටහිර* : ලොට් 94<br>බිම් ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 12 | 01. එම්. පී. විජේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1992.10.01 දින අංක 9123 දරන විකුණුම්කරය.<br><br>02. කේ. කළුආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1992.10.05 දින අංක 389 දරන උකස්කරය<br><br>03. කේ. පලිහක්කාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1995.07.03 දින අංක 1817 දරන උකස්කරය.<br><br>04. කේ. කළුආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1992.10.05 දින අංක 389 දරන උකස්කරය නිදහස් කිරීම. |

08 - 350

---

ලියාපදිංචි කිරීමආ 97
(එජ් 2) 2/64.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තර | පිහිටීම | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1455 | 2015.05.12 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | අංක. 6/3, මහසෙන් මාවත, 28 කණුව පොළොන්නරුව | ගරු උදයසිරි සෙනරත් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූලි මස 22 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-351/1

---

## ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංක : 1455

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | අංක 6/3, මහසෙන් මාවත, 28 කණුව, පොළොන්නරුව | තමන්කඩුව | පොළොන්නරුව | ගරු උදයසිරි සෙනරත් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2015ක් වූ ජූලි මස 22 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08-351/2

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1457 | 2015.06.10 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | තවලන්තැන්න, කොත්මලේ | ගරු එල්. ගනේෂන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-352/1

---

## ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංක : 1457

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන | ගොඩනැගිල්ල ලියා |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | අයිතිකරු හෝ භාරකරු | පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | අංක 131, තවලන්තැන්න, කොත්මලේ | කොත්මලේ | නුවරඑළිය | ගරු එල්. ගනේෂන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2015ක් වූ ජූලි මස 27 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08-352/2

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තර* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද* |
|---|---|---|---|---|---|
| 1456 | 2015.06.10 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | ලබුකැල, කොණ්ඩගල්ල, පෙදෙස, නුවර පාර, නුවරඑළිය | ගරු පී. කනගරාජන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/A 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-354/1

---

**ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය**

සහතික අංකය : 1456

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන* | *ගොඩනැගිල්ල ලියා* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | *අයිතිකරු හෝ භාරකරු* | *පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | ලබුකැල, කොන්ඩගල්ල, කොටස, ලබුකැල, නුවරඑළිය | කොත්මලේ | නුවරඑළිය | ගරු පී. කනගරාජන් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2015ක් වූ ජූලි මස 27 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08-354/2

---

**2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ II වැනි කොටසේ 9 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වර්ෂ 2013 ජූනි මස තුළ දී දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල පැවැති අධික වැසි සහ සුළි කුණාටු හේතුවෙන් හානියට පත් ''ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ'' ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි:-

1. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ රත්මලාන, මොරටුව සහ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස.
2. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ වත්තල, ජාඇල, කටාන සහ මීගමුව ප්‍රාදේශීය ලේකම්, කොට්ඨාස.
3. කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ කළුතර, බේරුවල සහ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස.
4. ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බලපිටිය, හික්කඩුව සහ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස,
5. මාතර පාරිපාලන දිස්ත්‍රික්කයේ වැලිගම, මාතර, දෙවිනුවර සහ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස,
6. ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත්, කින්නියා, මුතූර්, කුච්චවේලි සහ වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස.
7. මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කයේ, මන්නාරම නගර, නානාටාන්, මුසලි, මාන්තායි බටහිර සහ මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූලි මස 17 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 234/ඒ3 හි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-355

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015 ක් වූ ජුනි මස 26 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :-

"කොළඹ දරන ස්ථානයේ කැන්කෝ එන්ටර්ප්‍රයිසස් යන නාමය විලාශය සහ ආයතනය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන මීගමුව දරන ස්ථානයේ පදිංචි පද්මනාදන් ප්‍රගාෂ් කන්නා (ණයට ගන්නා) වෙත ප්‍රදනය කරන ලද ණය මුදල්/මූල්‍ය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිතයක් ලෙස ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ජී. දිසානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.09.27 දිනැති අංක 516 දරන උකස් බැඳුම්කරය මගින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) වෙත උකස් කොට සහ උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් හොඳින් විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සම්බන්ධයෙන් වූ උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ණයට ගන්නා විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද වර්ෂ 2015 ක් වූ මැයි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හැත්තෑ හතර ලක්ෂ තිස්නම දහස් පන්සිය හතලිස් නමයයි ශත විසි හතරක (රු.74,39,549.24) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින්ද, සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හැත්තෑ හතර ලක්ෂ තිස්නම දහස් පන්සිය හතලිස් නමයයි ශත විසි හතරක (රු.74,39,549.24) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2015 ජුනි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් හත් ලක්ෂ පනස් දහසක (රු.57,50,000) මුදල මත වසරකට සියයට දහහයි දශම හතයි පහක (17.75%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම්ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම්ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී ණය මුදල්/මූල්‍ය පහසුකම් සඳහා සුරක්ෂිතයක් ලෙස ඇති එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.''

#### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරලේ දූනගහපත්තුවේ මීගමුව නගර සභා සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 75- කට්ටුව ග්‍රාමසේවක නිලධාරී කොට්ඨාසය තුළ කට්ටුව හි පිහිටි ලොට් අංක C1 සහ D1 න් සමන්විත වූ කීනගහවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. එඩ්ගාර් ද සිල්වා විසින් මැන සාදන ලද 1994.02.06 දින අංක 2469 දරන පිඹුර පරිදි මැන බෙද වෙන් කළ ලොට් 1A දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට ටී. ෆේබියන් ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, නැගෙනහිරට එකී පිඹුරේ ලොට් 1B ද, දකුණට ඒ. ඒ. ක්ලේමන්ට් පෙරේරාගේ උරුමකරුවන්ට අයත් ඉඩමෙන් හා බටහිරට පාරක් සඳහා වෙන් කළ ඉඩමද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි පහක (අ. 0, රූ. 0, පර්. 7.35) ඉඩම සමඟ ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි ගස් කොළන් සහ එයට සම්බන්ධ සෑම සහ සියළු දේ ද වේ.

ඉහත කී ලොට් 1A දරන ඉඩම් කොටස එම පිඹුරේම අනු කොටසක් වන අතර සහ එහි වර්තමාන මායිම් සහ ප්‍රමාණය පහත දැක්වෙන පරිදි වේ :-

ඉහත කී පරිදි කට්ටුවහි පිහිටි ලොට් අංක C1 සහ D1 න් සමන්විත වූ කීනගහවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉහත කී අංක 2469 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 1A1A (අනු බෙදීමකි) දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට ටී. ෆේබියන් ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, නැගෙනහිරට ලොට් 1B ද, දකුණට ලොට් 1A 1B සහ බටහිරට පාරක් සඳහා වෙන් කළ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 6.5) ඉඩම සමඟ ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි, ගස් කොළන් සහ එයට සම්බන්ධ සෑම සහ සියළු දේ ද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දැනට සහ මින් මතුවට සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියළුම නිශ්චල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇමුණුම් ද ඇතුළුව විදුලිය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායු සමීකරණ පද්ධතිය ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

08-379

---

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2015 පෙබරවාරි මස 25 වැනි දින දී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් විසින් ලියා සහතික කරන ලද අංක 506 හා 2011 ජනවාරි මස 06 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් විසින් ලියා සහතික කරන ලද අංක 526 හා 2011 මැයි මස 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "ලෙස්ලි එන්ටර්ප්‍රයිසස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය කරගෙන යන හලාවත, බාලසූරිය මුදියන්සේලාගේ ජයතිලක, බාලසූරිය මුදියන්සේලාගේ බර්ට් රණසිංහ සහ සුන්දරප්පෙරුම මුදියන්සේලාගේ පියසීලි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී බාලසූරිය මුදියන්සේලාගේ ජයතිලක, බාලසූරිය මුදියන්සේලාගේ බර්ට් රණසිංහ සහ සුන්දරප්පෙරුම මුදියන්සේලාගේ පියසීලී යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් එක්කෝටි හැටලක්ෂ එකොළොස් දහස් නවසිය හැටතුනකුත් ශත හතලිස් පහක (රු. 1,60,11,963.45) මුදලක් 2014 දෙසැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි පනස් ලක්ෂ දහනවදහස් අටසිය තිස් නවයකුත් ශත අසූ පහක (රු. 1,50,19,839.85) මුදලක් සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික තැන්පතු පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතු හා අයවිය යුතුව ඇති හෙයින් ද ;

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වූ රුපියල් එක්කෝටි හැටලක්ෂ එකොළොස් දහස් නවසිය හැටතුනකුත් ශත හතලිස් පහක (රු. 1,60,11,963.45) සහ මුදල 2014 දෙසැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි පනස් ලක්ෂ දහනවදහස් අටසිය තිස් නවයකුත් ශත අසූ පහක (රු. 1,50,19,839.85) මුදලක් සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික තැන්පතු පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.ඩී.ආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයන් මත ගණනයකරන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 506 හා 526 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 506 හා 526 දරන උකස් බැඳුම්කර මගින් එකී බාලසූරිය මුදියන්සේලාගේ ජයතිලක යන අය විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 506 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, දෙමටපිටිය ග්‍රාමයේ පිහිටි "දෙමටපිටියකැලේ" නමැති ඉඩමේ, බලයලත් මානක වර්නන් පෙරේරා මැන සකස් කළ අංක 7649 හා 1998 නොවැම්බර් 14 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : අංක 7649 දරන පිඹුරේ ලොට් අංක 2 ද, *නැගෙනහිරට* : එම්. ජයමන් සිල්වාට අයිති ඉඩම ද, *දකුණට* : හලාවත - කුරුණෑගල ප්‍රධාන පාර ද *බස්නාහිරට* : අංක 7649 පිඹුරේ ලොට් අංක 4 සහ අඩි 15ක් පළල පාර ද යන මායිම් ඇතුළත එකී අංක 7649 දරන පිඹුර ප්‍රකාර අක්කර 1ක් (අ. 1, රූ.0, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

**අංක 526 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ හොරකැලේ ග්‍රාමයේ පිහිටි "පැලවත්ත නොහොත් හොරකැලේ වත්ත" දැනට "හොරකැලේ එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කරන ලද අංක 1317 හා 2011 අප්‍රේල් මස 29 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1D ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ, *උතුරට* : බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කළ අංක 1316 හා 2011.04.29 දිනැති පිඹුරේ ලොට් 1C ද, බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර මැන සකස් කළ අංක 701A හා 2009.12.31 දිනැති පිඹුරේ ලොට් 1A ද, බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කළ අංක 1008 හා 2010.09.03 දිනැති පිඹුරේ ලොට් 1C (අඩි 20ක් පළල පාර ද) බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A දරන පිඹුරේ ලොට් 9, 10 සහ 11ද, *නැගෙනහිරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A හා 2005.10.17 දිනැති පිඹුරේ ලොට් අංක 100 ද, *දකුණට* : මහපාරේ සිට එන පාර සහ එස්. ඒ. සුසුමාවතී හිමිකම් කියන ඉඩම ද *බස්නාහිරට* : සේන ජනක, මදුරාවතී, සුනිල්, ජයතිස්ස, අනුර, එස්. එම්. සමන්ත සහ සන්ධ්‍යා හිමිකම් කියන ඉඩම් ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1317 දරන පිඹුර ප්‍රකාර අක්කර හතරකුත් පර්චස් විසිනවයයි දශම පහක් (අ. 4, රූ.0, පර්. 29.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර මැන සකස් කළ ඉහත කී අංක 1317 හා 2011 අප්‍රේල් මස 29 වැනි දින දරන පිඹුරේ ලොට් 1D ලකුණු කළ බිම් කට්ටිය මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසක් වේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරකැලේ ග්‍රාමයේ පිහිටි "පැලවත්ත නොහොත් හොරකැලේවත්ත" (දැනට "හොරකැලේඑස්ටේට්") නමැති ඉඩමේ බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කරන ලද අංක 834 හා හා 2010 අප්‍රේල් මස 22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1B ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ, *උතුරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A දරන පිඹුරේ ලොට් 1, 2, 3, 4 සහ 5 ද බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කරන ලද අංක 701A හා 2009.12.31 දිනැති පිඹුරේ ලොට් 1A ද, බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A හා 2005.10.17 දිනැති පිඹුරේ ලොට් අංක 49 (අඩි 20 පළල පාර) ද බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A පිඹුරේ ලොට් අංක 9, 10, 11 ද *නැගෙනහිරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A හා 2005.10.17 දිනැති පිඹුරේ ලොට් අංක 100 ද, *දකුණට* : මහපාරේ සිට එන පාර සහ එස්. ඒ. සුසුමාවතී හිමිකම් කියන ඉඩම ද *බස්නාහිරට* : සේන, ජනක, මදුරාවතී, සුනිල්, ජයතිස්ස, අනුර, එස්. එම්. සමන්ත සහ සන්ධ්‍යා හිමිකම් කියන ඉඩම් ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් එකකුත් පර්චස් දහහතක් (අ. 4, රූ.1, පර්. 17) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඉහත සඳහන් ඉඩම බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කළ ඉහත කී අංක 834 හා 2010 අප්‍රේල් මස 22 වැනි දින දරන පිඹුරේ ලොට් 1B ලකුණු කළ බිම් කට්ටිය මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසක් වේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරකැලේ ග්‍රාමයේ පිහිටි "පැලවත්ත නොහොත් හොරකැලේවත්ත" (දැනට "හොරකැලේඑස්ටේට්") නමැති ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669D හා 2007 අගෝස්තු මස 11 වැනි දිනැති පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ, *උතුරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A දරන පිඹුරේ ලොට් 1, 2, 3, 4, 5, 6, 7, 49, 9, 10 සහ 11 ද *නැගෙනහිරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A දරන පිඹුරේ ලොට් අංක 100 ද, *දකුණට* : මහපාරේ සිට එන පාර සහ එස්. ඒ. ඩී. සුසුමාවතී හිමිකම් කියන ඉඩම ද සහ *බස්නාහිරට* : සේන, ජනක, මදුරාවතී, සුනිල්, ජයතිස්ස, අනුර, එස්. එම්. සමන්ත සහ සන්ධ්‍යා හිමිකම් කියන ඉඩම් ද යන මායිම් ඇතුළත එකී අංක 3669D දරන පිඹුර ප්‍රකාර අක්කර හතරකුත් රූඩ් එකකුත් පර්චස් තිහක් (අ. 4, රූ.1, පර්. 30) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

තවද මීට මෙහි පහත විස්තර කර තිබෙන මාර්ගය තුළින් එය මතින් හෝ ඔස්සේ, උකස්කරුට ද ඔහුගේ අමුත්තන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ට මින් ඉදිරියට ඔවුන්ගේ කැමැත්ත පරිදි සෑම කල්හිම හා සදාකාලයට කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ දී පයින් හෝ අන්‍යාකාරයකින් අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් සහිතව හෝ නොමැතිව බර පැටවූ හෝ නොපැටවූ මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම වර්ගයකම වෙනත් වාහන මගින් යාම ඒමේ හා ප්‍රත්‍යාගමනය කිරීමේ අයිතිවාසිකම ද ඒ සමග සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගන්නා හෝ භුක්ති විඳින සියළු හා එක් එක් අයිතිවාසිකම්, වරප්‍රසාද හා අනුබන්ධන ද, තවද එයට ඉහළින්, යටින් හෝ එය ඔස්සේ විදුලි රැහැන්, උඩින් කම්බි සහ ජලාපවහන, ගෑස් සහ ජලනල එළීමේ හා වෙනත් උචාරණ හා ක්‍රමෝපාය යෙදීමේ අයිතිය ද ඇතුළත් වේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරකැලේ ග්‍රාමයේ පිහිටි "පැලවත්ත නොහොත් හොරකැලේවත්ත" (දැනට "හොරකැලේඑස්ටේට්") නමැති ඉඩමේ බලයලත් මානක එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් මැන සකස් කරන ලද අංක 1008 හා 2010 සැප්තැම්බර් මස 03 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 C ලෙස ලකුණු කළ (අඩි 20ක් පළල පාර වූ) බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, *උතුරට* : මාදම්පේ සහ කුලියාපිටිය අතර මහපාර ද *නැගෙනහිරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් මැන සකස් කළ අංක 3669A හා 2005.10.17 දින දරන පිඹුරේ ලොට් 9 ද, *දකුණට* : බලයලත් මානක එම්. කේ. එම්. එස්. ප්‍රියංකර මැන සකස් කළ අංක 834 පිඹුරේ ලොට් 1B ද, *බස්නාහිරට* : බලයලත් මානක ඩබ්ලිව්. ඒ. සිරිසේන මැන සකස් කළ අංක 3669A පිඹුරේ ලොට් අංක 7 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1008 පිඹුර ප්‍රකාර පර්චස් නවයක් (අ. 0, රූ.0, පර්. 9) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

***යන්ත්‍රෝපකරණ :***

| | *සංඛ්‍යාව* | *විස්තරය* |
|---|---|---|
| 1. | 02 | ෆයිබර් මික්සිං මැෂින් (අ.බ. 40)<br>DECODE - පැලෝමා සුදුවැල්ල, මාදම්පෙ |
| 2. | 01 | කොකනට් හස්ක් ක්‍රෂර්<br>LD 1511 (අ.බ. 10)<br>පැලෝමා සුදුවැල්ල, මාදම්පෙ |
| 3. | 02 | රොටරි මැෂින් (චංචල) |
| 4. | 01 | MGB 99 series - කම්පැක්ට් ග්‍රෝ බෑග් මැෂින්<br>ස්ලැබ් සයිස් - අවම සෙ.මී. 60 - උපරිම සෙ.මී. 120<br>මෝටරය - අ.බ. 30 (තෙකලා)<br>නිෂ්පාදන ශක්තිය - පැයට ස්ලැබ් 110 - 130 |
| 5. | 02 | කි.ග්‍රෑ. 25 බෑගර් මැෂින්<br>බේල් සයිස් - සෙ.මී. 44 x සෙ.මී. 32 (සෙ.මී. 76 - සෙ.මී. 82)<br>මෝටරය - අ.බ. 20<br>නිෂ්පාදන ශක්තිය - පැය 8 ට බ්ලොක් 200 - 250 |
| 6. | 01 | MGB - 79 series - කම්පැක්ට් කි.ග්‍රෑ. 5 බේලිං මැෂින්<br>බේල් සයිස් - සෙ.මී. 30 x සෙ.මී. 30 x සෙ.මී. 15<br>මෝටරය - අ.බ. 30<br>නිෂ්පාදන ශක්තිය - පැයට බේල් 110 - 130 |

***අංක 02 දේපළ :***

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, යගම් පත්තුවේ, දෙමටපිටිය ග්‍රාමයේ පිහිටි "දෙමටපිටියකැලේ" නමැති ඉඩමේ බලයලත් මානක වර්නන් පෙරේරා මැන සකස් කරන ලද අංක 7649 හා 1998 නොවැම්බර් මස 14 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට වූ, *උතුරට* : අංක 7649 දරන පිඹුරේ ලොට් අංක 2 ද, *නැගෙනහිරට* : එම්. ජයමන් සිල්වාට අයිති ඉඩම ද, *දකුණට* : හලාවත - කුරුණෑගල ප්‍රධාන පාරද, *බස්නාහිරට* : අංක 7649 පිඹුරේ ලොට් අංක 4 සහ අඩි 15ක් පළල පාර ද යන මායිම් ඇතුළත එකී අංක 7649 දරන පිඹුර ප්‍රකාර අක්කර එකක් (අ. 1, රූ.0, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

08 - 435

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දක්වෙන යෝජනා සම්මතය 2015 පෙබරවාරි මස 25 වැනි දින දී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. බී. සී. ගුණතිලක විසින් ලියා සහතික කරන ලද අංක 5629 හා 2012 ජූලි මස 04 වැනි දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම බත්තරමුල්ලේ පදිංචි ශාන්ත ආරච්චිගේ ප්‍රියන්ත සුමිත් ජයසිංහ සහ ශාන්ත ආරච්චිගේ ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද :

2015 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී ශාන්ත ආරච්චිගේ ප්‍රියන්ත සුමිත් ජයසිංහ සහ ශාන්ත ආරච්චිගේ ජයසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් හැටහත් ලක්ෂ හැත්තෑහතර දහස් තුන්සිය තිස්තුනකුත් ශත අසූහතරක (රු. 67,74,333.84) මුදලක් සහ 2015 පෙබරවාරි මස 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතළිස්හත් ලක්ෂ අනූනව දහස් දෙසිය එකොළහකුත් ශත හැත්තෑනවයක (රු. 47,99,211.79) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතු හා අයවිය යුතුව ඇති හෙයින් ද :

ඉහත කී අංක 5629 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වූ රුපියල් හැටහත් ලක්ෂ හැත්තෑහතර දහස් තුන්සිය තිස්තුනකුත් ශත අසූහතරක (රු. 67,74,333.84) මුදලක් සහ 2015 පෙබරවාරි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතළිස්හත් ලක්ෂ අනූනව දහස් දෙසිය එකොළහකුත් ශත හැත්තෑනවයක (රු. 47,99,211.79) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කර වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5629 දරන උකස් බැඳුම්කරය මගින් ශාන්ත ආරච්චිගේ ජයසිංහ යන අය විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 5629 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත දකුණු තලංගම පිහිටි "සෙන්ට් තෝමස් එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, බලයලත් මානක ඩී. ටී. එම්. නානායක්කාර මැන සකස් කළ අංක 1083 හා 1996.05.10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 94 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ, *උතුරට* : ලොට් අංක 95 ද, *නැගෙනහිරට* : ලොට් අංක 86 ද, *දකුණට* : ලොට් අංක 93 ද සහ *බස්නාහිරට* : ලොට් අංක 108 ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අ. 0, රූ.0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හා එය අනුබද්ධ සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඉහත කී ඉඩම, බලයලත් මානක බී. ආර්. ආර්. පී. ජයසූරිය මැන සකස් කළ අංක 1988 හා 2005.05.08 දින දරන මැනුම් පිඹුරට අනුව දැනට පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ ඃ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත දකුණු තලංගම පිහිටි "සෙන්ට් තෝමස් එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, ඉහත කී අංක 1988 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 94A ලෙස ලකුණු කළ වික්‍රමසිංහපුර, 1 වන පටුමග, වරිපනම් අංක 22/1A, 22/1A1 සහ 22/2 දරන ගොඩනැගිලිද සමග වූ බිම් කට්ටියට මායිම් *උතුරට* : එම්. ඒ. මිල්ලගස්තැන්නේට අයිති (අංක 1083 දරන පිඹුරේ ලොට් අංක 95) ඉඩම ද, *නැගෙනහිරට* : යූ. ආර්. රණසිංහට අයිති (අංක 1083 පිඹුරේ ලොට් අංක 86) ඉඩම ද, *දකුණට* : සී. ඒ. චිත්‍රා මාලිනීට අයිති (අංක 1083 පිඹුරේ ලොට් අංක 93) ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අ. 0, රූ.0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ඊට අනුබද්ධ සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

08 - 436

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.